**විශේෂ සටහන 13**

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2008[1]

### මූරසිධත අංශය

| | | |
|---|---|---|
| 2008 පෙබරවාරි 01 | - | මගී ප්‍රවාහන බස් ගාස්තු සියයට 6 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් වැඩි කරන ලදී. |
| 2008 මාර්තු 30 | - | විදුලි ගාස්තු සියයට 35 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් වැඩි කරන ලදී. |
| 2008 අප්‍රේල් 21 | - | කුඩා පරිමාණයේ කිරි ගව පාලන සංවර්ධන ව්‍යාපෘතිවල හා කිරි හා කෘෂිකාර්මික භෝග සැකසීමේ කර්මාන්තවල නියුතු ගොවීන් සවිබල ගැන්වීම ඉලක්ක කර ගනිමින් "කෘෂිකාර්මික පශු සම්පත් සංවර්ධන ණය" නමැති ණය ආධාර ක්‍රමය හඳුන්වා දෙන ලදී. |
| 2008 මැයි 25 | - | ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යාමට සමගාමීව පෞද්ගලික හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල මගී ප්‍රවාහන බස් ගාස්තු පිළිවෙලින් සියයට 27 ක හා සියයට 17 ක ප්‍රතිශතයන්ගෙන් වැඩි කරන ලදී. |
| 2008 ජුනි 01 | - | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් බෙදා වෙන් කරන ලද කලාප 4 ක් අනුව දුම්රිය ගාස්තු විවිධ ප්‍රතිශතයන්ගෙන් වැඩි කරන ලදී. |
| 2008 ජුලි 01 | - | නව සපිරි ග්‍රාමීය ණය යෝජනාක්‍රමය සහ කෘෂි නවෝදය වැඩසටහන් යටතේ ණයදීමේ අනුපාතිකය සියයට 8 සිට සියයට 12 දක්වා වැඩි කරන ලදී. |
| 2008 සැප්තැම්බර් 20 | - | මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් සඳහා විශේෂ ණය සහතික යෝජනා ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. |
| 2008 නොවැම්බර් 12 | - | ඛනිජ තෙල් මිල ගණන් අඩු වීමට සමගාමීව මගී ප්‍රවාහන බස් ගාස්තු සියයට 17.2 කින් පහත දමන ලදී. |
| 2008 දෙසැම්බර් 01 | - | ඒකක 90 කට වඩා අඩුවෙන් විදුලිය භාවිතා කරන පාරිභෝගිකයන් හට මසකට රුපියල් 30 ක වට්ටමක් ලබාදෙන ලදී. |
| | - | රුපියල් 20 ට වඩා වැඩි දුම්රිය ගාස්තු සියයට 10 සිට සියයට 17 අතර ප්‍රතිශතයන්ගෙන් අඩු කරන ලදී. |
| 2008 ජනවාරි 06 | - | මගී ප්‍රවාහන බස් ගාස්තු සියයට 4 කින් පහත දමන ලදී. |
| 2008 ජනවාරි 09 | - | සංචාරක හෝටල් සහ කර්මාන්ත සඳහා, විදුලිබල මණ්ඩලය විසින් අයකරන ලද ඉන්ධන ගැලපුම් ගාස්තුව, 2009 ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා ඉවත් කරන ලදී. |

**අපේක්ෂිත**

- දිළිඳු බව තුරන් කිරීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතියේ II වන අදියර යෝජනා ක්‍රමය යුද්ධයෙන් බලපෑමට ලක්වී ඇති ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීමේ අරමුණෙන් ක්‍රියාත්මක කිරීම.
- ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායක අංශය සඳහා සපිරි ණය සහතික යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.

### විදේශ අංශය

**වෙළෙඳ සහ තීරුබ**

| | | |
|---|---|---|
| 2008 ජනවාරි 01 | - | ආනයන තීරු බදු අධිභාරය සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කරන ලදී. |

1. 2008 වර්ෂයේ සහ 2009 වර්ෂයේ පළමු මාස තුන තුළදී ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මීට ඇතුළත් වේ. 2009 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය වෙනස්කම් හා ක්‍රියාමාර්ග ද මීට ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| 2008 ජනවාරි 09 | - | අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය දහයක් ආනයනයේදී අයකරන ලද තීරු බදු, එකතු කළ අගය මත බදු, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද, සමාජීය වගකීම් ගාස්තුව සහ රේගුවේදී අය කෙරෙන අනෙකුත් ගාස්තු වෙනුවට විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද නමින් තනි බද්දක් හඳුන්වා දෙන ලදී. |
| 2008 අප්‍රේල් 03 | - | පාම් තෙල් සහ පොල් තෙල් ආනයනය සඳහා සියයට 23 ක තීරු බදු අත් හැරීමක් ලබාදෙන ලදී. |
| 2008 මැයි 01 | - | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අදාළ යැයි කලින් හඳුන්වා දුන් ආහාර ද්‍රව්‍ය දහයට අමතරව කිරිපිටි ආනයනය ද මෙම බද්දට යටත් කරන ලදී. |
| | - | ශ්‍රී ලංකා ධජය යටතේ ලියාපදිංචි කරන ලද නැව් සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා ගුවන් යානා වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2008 මැයි 25 | - | පෙට්‍රල් ආනයනය මත ලබා දී තිබූ ලීටරයකට රුපියල් 20 ක තීරු බදු අත් හැරීම ඉවත් කරන ලදී. |
| 2008 ජූලි 25 | - | පාම් තෙල් සහ පොල් තෙල් ආනයනය සඳහා ලබා දී තිබූ තීරු බදු අත්හැරීම් සියයට 23 සිට සියයට 13 දක්වා අඩු කරන ලදී. |
| 2008 අගෝස්තු 25 | - | සහල් ආනයනය සඳහා වන තීරු බද්ද තාවකාලිකව අත්හිටුවන ලදී. |
| 2008 සැප්තැම්බර් 16 | - | අර්තාපල් ආනයනය සඳහා වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 15 සිට රුපියල් 20 දක්වා වැඩිකරන ලදී. |
| | - | පෙට්‍රල් හා ඩීසල් ආනයනය මත පිළිවෙලින් ලීටරයකට රුපියල් 15 හා රුපියල් 10 බැගින් සෙස් බද්දක් පනවන ලදී. |
| 2008 නොවැම්බර් 07 | - | තිරිඟු ඇට ආනයනය සඳහා වන ආනයන තීරු බද්ද කිලෝ ග්‍රෑමයකට සියයට 6 සිට සියයට 10 දක්වා වැඩි කරන ලදී. |
| | - | සීනි ආනයනය සඳහා වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 14 සිට රුපියල් 16 දක්වා වැඩිකරන ලදී. |
| | - | කිරිපිටි ආනයනය සඳහා වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 5 සිට රුපියල් 15 දක්වා වැඩි කරන ලදී. |
| | - | තිරිඟු පිටි හා තෝරාගත් වර්ග වල ගම්මිරිස්, වැනිලා, කරාබු නැටි සහ කරඳමුංගු ආනයනය මත සියයට 5 ක සෙස් බද්දක් පනවන ලදී. |
| | - | උඳු, කුරක්කන්, තල ඇට, නිවාස හා කාර්යාල සඳහා වන ගෘහ භාණ්ඩ සහ පිඟන් සෝදන යන්ත්‍ර සඳහා සියයට 15 ක සෙස් බද්දක් පනවන ලදී. |
| | - | ලේටෙක්ස් රබර් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රුපියල් 35 ක සෙස් බද්දක් පනවන ලදී. |
| | - | තේ ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රුපියල් 4 ක සෙස් බද්දක් පනවන ලදී. |
| | - | බඩඉරිඟු ආනයනය සඳහා වන සෙස් බද්ද සියයට 20 සිට 25 දක්වා වැඩිකරන ලදී. |
| | - | තෝරාගත් එළවළු වර්ග ගණනාවක් ආනයනය කිරීමේදී සියයට 20 ක් හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 25 ක් වන සෙස් බද්දක් පනවන ලදී. |
| | - | පොලිතීන් සහ ප්ලාස්ටික් ආනයනය මත වන සෙස් බද්ද සියයට 1 සිට සියයට 5 දක්වා වැඩි කරන ලදී. |
| | - | තෝරාගත් පළතුරු වර්ග ආනයනය සඳහා සෙස් බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 40 සිට රුපියල් 60 දක්වා වැඩි කරන ලදී. |

- ශීතකරණ ආනයනය සඳහා වන සෙස් බද්ද සියයට 15 සිට සියයට 20 දක්වා වැඩි කරන ලදී.
- චොක්ලට් සහ බිස්කට් ආනයනය සඳහා වන සෙස් බද්ද සියයට 30 හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 40 සිට සියයට 35 හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 60 දක්වා යන දෙකෙන් ඉහළ අගයට වැඩි කරන ලදී.
- සාරි ආනයනයේදී අදාල වන සෙස් බද්ද සියයට 30 හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 60 සිට සියයට 30 හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 75 දක්වා වැඩි කරන ලදී (දෙකෙන් වැඩි අගය අය කරනු ලැබේ).
- ආයුර්වේද ශාක සාර නිෂ්පාදන ආනයනය සඳහා වන සෙස් බද්ද සියයට 30 සිට සියයට 35 හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 200 ක් ලෙස වැඩි කරන ලදී (දෙකෙන් වැඩි අගය අයකරනු ලැබේ).
- තෝරාගත් වර්ගවල තීන්ත ආනයනය සඳහා සෙස් බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 75 සිට රුපියල් 85 දක්වා වැඩි කරන ලදී.
- දියලුණු ආනයනයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 10 ක සෙස් බද්දක් පනවන ලදී.
- පාවහන් ආනයනය සඳහා වන සෙස් බද්ද සියයට 25 හෝ පාවහන් යුගලයකට රුපියල් 300 සිට සියයට 30 ක් හෝ පාවහන් යුගලයකට රුපියල් 400 දක්වා වැඩි කරන ලදී.
- සිමෙන්ති ආනයනය සඳහා සියයට 10 ක සෙස් බද්දක් පනවන ලදී.
- ස්වර්ණාභරණ හා ඒවායේ කොටස් ආනයනය සඳහා වන සෙස් බද්ද සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී.
- තේ පැකට් සහ තේ බෑග් අපනයන සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.
- තඹ, රිදී වැනි අමු ද්‍රව්‍ය සහ සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය තීරු බද්දෙන් සහ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- තෝරාගත් වර්ගවල අන්තර් භාණ්ඩ, ඇසුරුම් ද්‍රව්‍ය, අමු ද්‍රව්‍ය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශාධාර ලබන ව්‍යාපෘතිවල ප්‍රයෝජනයට ගනු ලබන ද්‍රව්‍ය ආනයන තීරු බද්දෙන් නිදහස් කරන ලදී.
- ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ වන අවශේෂ භාණ්ඩ ලැයිස්තුවේ ඇති භාණ්ඩ ආනයනය තීරු බද්දෙන් නිදහස් කරන ලදී.
- පකිස්ථාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ප්‍රකාර අනුක්‍රමික ලැයිස්තුවේ වරණීය තීරු ගාස්තු සියයට 20 ක් ඇති භාණ්ඩ සඳහා තීරු බදු අත් හැරීමක් ලබාදෙන ලදී.
- කඩදාසි සහ කඩදාසි පුවරු, ධාන්‍ය ඇඹරීමට අවශ්‍ය වන යන්ත්‍ර, ඇට වර්ගසහ ධාන්‍ය, අමු කපු රෙදි වර්ග සහ බලශක්ති පිරිමැසුම් ප්‍රතිවර්ත්‍ය ධාරා ප්‍රතිදීප්ත පහන් ආනයන තීරු බද්දෙන් නිදහස් කරන ලදී.
- පොලියෙස්ටර් සඳහා වන ආනයන තීරු බද්ද සියයට 2.5 සිට සියයට 6 දක්වා වැඩිකරන ලදී.
- (ලොරි, මෝටර් රථ හා වෙනත් වාහන සඳහා භාවිතා කරන) ටයර් ආනයනය සඳහා වන තීරු බද්ද සියයට 28 හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 90 දක්වා වැඩි කරන ලදී.
- රතු සීනි ආනයනය සඳහා වන තීරු බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 10 සිට රුපියල් 12 දක්වා වැඩි කරන ලදී.
- සිමෙන්ති ආනයනය සඳහා වන තීරු බද්ද සියයට 15 සිට සියයට 6 දක්වා අඩුකරන ලදී.

| | |
|---|---|
| | - වායු සමීකරණ යන්ත්‍ර ආනයනය මත වන තීරු බද්ද සියයට 15 සිට සියයට 28 දක්වා වැඩි කරන ලදී. |
| | - සිලින්ඩර ධාරිතාවය හා නිෂ්පාදිත වර්ෂය අනුව අවමංගල්‍ය රථ සහ ගෑස් බලයෙන් ක්‍රියා කරන ත්‍රී රෝද රථ සඳහා නිෂ්පාදන බද්දක් පනවන ලදී. |
| | - පෙට්‍රල් සඳහා ලීටරයකට රුපියල් 10 ක, ඩීසල් සඳහා ලීටරයකට රුපියල් 5 ක සහ තිරිඟු ඇට ආනයනයේදී සියයට 5 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී. |
| 2008 නොවැම්බර් 19 | - පෙට්‍රල් ආනයනය සඳහා ලබාදී තිබූ තීරු බදු අත් හැරීම අත්හිටුවන ලදී. |
| 2008 දෙසැම්බර් 02 | - ඩීසල් හා තිරිඟු ඇට ආනයනයේදී ලබා දී තිබූ තීරු බදු අත්හැරීම අත්හිටුවන ලදී. |
| 2008 දෙසැම්බර් 03 | - කෑමට ගනු ලබන තෙල් වර්ග (සෝයා බෝංචි තෙල්, ඔලිව් තෙල් සහ පාම් තෙල්) ආනයනය මත වන තීරු බද්ද වැඩි කරන ලදී. |
| 2009 ජනවාරි 01 | - වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද සියයට 3 සිට සියයට 5 දක්වා වැඩි කරන ලදී. |
| | - සමහර වර්ගවල ඛනිජ තෙල් සහ බිටුමිනස්, ඛනිජ වලින් ලබාගන්නා තෙල්, බොර තෙල්, කාබනික රසායන, ඖෂධ සහ කොළ මඩින යන්ත්‍ර, ලනු අඹරන යන්ත්‍ර, ගොතන මැෂින්, මහන මැෂින් සහ රෙදි මදින යන්ත්‍ර යනාදී යන්ත්‍ර සඳහා සියයට 2 ක සහනදායී වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු අනුපාතිකයක් පනවන ලදී. |
| | - තෝරා ගත් වර්ග වල දියමන්ති, වටිනා ගල් වර්ග, රිදී, රත්තරන්, ප්ලැටිනම් ආදිය වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2009 ජනවාරි 21 | - කිරිපිටි ආනයනය සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සියයට 15 සිට සියයට 35 දක්වා වැඩි කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය**

| | |
|---|---|
| 2008 මැයි 29 | - වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකකයන්හි පවත්වාගෙන යන විශේෂ විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් හරහා, මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් හට ඔවුන්ගේ ව්‍යාපාරික අවශ්‍යතාවයන් සඳහා නිදහසේ විදේශ විනිමය ගනුදෙනු සිදුකිරීමට අවසර ලබා දෙන ලදී. |
| 2008 ජූනි 02 | - විදේශීය පුරවැසියන්, විදේශයන්හි නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්, විදේශීය ආයතනික ආයෝජකයන් හා ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කළ සංස්ථාපිත ආයතනවලින් අරමුදල් ලබා ගැනීම සඳහා විදේශීය ව්‍යවහාර මුදලින් මෙන්ම දේශීය රුපියල්වලින් ද ගනුදෙනු කළ හැකි "විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම" (SFIDA) නම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. |
| 2008 ජූලි 02 | - 2008 ජූලි 01 වැනි දින වන විට අවහිර ගිණුම්වල (Blocked Accounts) බැරට ඇති සියලුම මුදල් ශේෂයන් ප්‍රතිමුඛ ප්‍රේෂණය සඳහා මුදාහැරීමට අවසර ලබා දෙන ලදී. |
| | - 2008 ජූලි 01 වැනි දිනෙන් පසු පවත්නා අවහිර ගිණුම්වල තැන්පත් කළ හෝ අළුතෙන් ආරම්භ කළ අවහිර ගිණුම්වල බැරට ඇති මුදල් ශේෂයන්ගෙන් එක් වසරක් තුළ එ.ජ.ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා ප්‍රතිමුඛ ප්‍රේෂණය සඳහා මුදා හැරීමට අවසර ලබාදෙන ලදී. |
| | - ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට යන පුද්ගලයන්ට නිකුත් කරනු ලබන විදේශ විනිමය ප්‍රමාණය පවුලකට හෝ පිටත්ව යන අවස්ථාවේ තම පවුලේ සාමාජිකයන් කැටුව නොයන තනි පුද්ගලයෙකුට රුපියල් දශ ලක්ෂ 1 සිට ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 15 දක්වා (එ.ජ.ඩොලර් 150,000) වැඩි කරන ලදී. |

2008 ජූලි 10 - "ශ්‍රී ලංකාව - මගේ සිහින නිවස" වැඩසටහන යටතේ තවදුරටත් ශ්‍රී ලංකාවේ වාසය කිරීමට කැමති විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හට (වයස අවුරුදු 55 ට වැඩි) නේවාසික වීසා බලපත්‍ර ලබාදීම සඳහා රජය විසින් ගෙන ඇති තීරණයට පහසුකම් සැපයීම වෙනුවෙන් "ජ්‍යෙෂ්ඨ විදේශ පුරවැසි ස්ථාවර තැන්පතු ගිණුම" (SFNFDA) නැමැති විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

2008 ජූලි 11 - එතෙර ගමන් කරන ශ්‍රී ලාංකිකයන්ට දෙනු ලබන විදේශ ගමන් දීමනා වලින් කොටසක් ලෙස දැනට නිකුත් කරනු ලබන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය එ.ජ.ඩොලර් 1,000 සිට එ.ජ.ඩොලර් 2,000 හෝ ඒ සමාන වටිනාකම් ඇති අනිකුත් ව්‍යවහාර මුදල් වටිනාකම් දක්වා වැඩි කරන ලදී.

2008 අගෝස්තු 26 - 1953 අංක 24 දරණ විනිමය පාලන පනතෙහි 7 (අ) වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයන්ට අන්තර්ජාතික රාජ්‍ය සුරැකුම්පත් මිලදී ගැනීම සම්බන්ධ ගෙවීම් කිරීමට බලයලත් වෙළෙඳුන් වෙත අවසරය ප්‍රදාන කරනු ලැබූ අතර විනිමය පාලන පනතේ 11 (2) සහ 17 (2) වගන්තීන්හි ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයන්ට අන්තර්ජාතික රාජ්‍ය සුරැකුම්පත් පැවරීම සහ බලයලත් වෙළෙඳුන් අතර එවැනි අන්තර්ජාතික රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු කිරීමට අවසරය ප්‍රදානය කරනු ලැබීය.

2008 නොවැම්බර් 04 - එතෙර ගමන් කරන්නන් සඳහා එක් පුද්ගලයෙකුට නිදහස් කරන විදේශ විනිමය ප්‍රමාණය එ.ජ.ඩොලර් 5,000 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් සමාන වන ප්‍රමාණයකට වැඩි ඕනෑම විදේශ විනිමය ප්‍රමාණයන් පිළිබඳව මාසික පදනම යටතේ විනිමය පාලක වෙත වාර්තා කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

2008 දෙසැම්බර් 03 - නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම් ආරම්භ කළහැකි අවම තැන්පතු අවශ්‍යතාවය දැනට පවතින එ.ජ.ඩොලර් 500 ට හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන වන ප්‍රමාණයක සිට එ.ජ.ඩොලර් 100 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන වන ප්‍රමාණයක් දක්වා අඩුකරන ලදී.

- අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම් හිමියන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන්ගෙන් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ බැරට විදේශ මුදල් භාර ගැනීමට ලබා දී තිබූ එ.ජ. ඩොලර් 1000 සීමාව ඉවත් කළ අතර, සමීපතම පවුලේ සාමාජිකයන්ගෙන් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමවල බැරට අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඕනෑම මුදලක් භාර ගැනීමට අවසරය දෙන ලදී.

2008 දෙසැම්බර් 08 - පූර්ව ගෙවීම් පදනම මත කරන ආනයන භාණ්ඩ සඳහා මුළු ඉන්වොයිස් වටිනාකම මත වූ සියයට සියයක ආන්තික තැන්පතුවක් එම භාණ්ඩවලට ගෙවීම් කරනු ලබන අවස්ථාවේ ආනයනකරු විසින් බැංකුවෙහි තැන්පත් කිරීමේ අවශ්‍යතාවය පනවන ලදී.

2009 ජනවාරි 01 - ආමුඛ ප්‍රේෂණ දිරිගැන්වීම සඳහා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් සහ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සඳහා බලයලත් වෙළෙඳුන් විසින් ගෙවනු ලබන පොලිය මත සියයට 20 ක ප්‍රසාද පොලියක් රුපියල් වලින් ගෙවීම ශ්‍රී ලංකා රජය විසින් 2009 පෙබරවාරි 01 සිට ආරම්භ කරන ලදී.

## රාජ්‍ය මූල්‍ය අංශය

### රාජ්‍ය ආදායම

2008 ජනවාරි 01 - පහත දැක්වෙන අයිතම සඳහා අදාළ එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී;

- පෙට්‍රල් ආනයනය හෝ සැපයීම

- චිත්‍රපට කර්මාන්තය සඳහා සූත්‍රිකා විදුලි පහන් හෝ විසර්ජන විදුලි පහන් පාරජම්බුල හෝ අධෝරක්ත පහන් සහ චාප පහන් කාබන් ආනයනය.

- පහත දැක්වෙන අයිතමයන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී;
  - සමූපකාර ග්‍රාමීය බැංකු විසින් ඉටුකරනු ලබන මූල්‍ය සේවාවන්
  - 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි වූ සමූපකාර සමිති විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවාවන්
  - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් රටේ සංවර්ධනය කෙරෙහි වැදගත් වේ යැයි හඳුනාගෙන ඇති විශේෂ ව්‍යාපෘති හා උපාය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ලෙස හඳුනාගත් ව්‍යාපෘති සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සහ ආනයනය.
  - *නැගෙනහිර නවෝදය* වැඩ සටහන යටතේ බදු විරාම ලබා ගැනීමට සුදුසුකම් ලබන ව්‍යාපාර විසින් සිය ව්‍යාපාර අරමුණු වෙනුවෙන් ආනයනය කරනු ලබන ඕනෑම යන්ත්‍රසූත්‍ර හෝ උපකරණ
  - දේශීයව නිෂ්පාදනය කරන සීනි, ශ්‍රී ලංකාවේ කිරිවලින් නිපදවනු ලබන කිරි ආහාර හා දේශීය සහල් වලින් නිෂ්පාදනය කරන සහල් ආශ්‍රිත නිෂ්පාදන
  - රෙදිපිළි කර්මාන්තය සඳහා නූල් ආනයනය හෝ සැපයීම

- සමාජ වගකීම් බදු අනුපාතය සියයට 1 සිට සියයට 1.5 දක්වා ඉහළ නංවන ලදී.

- ජංගම දුරකථන සඳහා අදාළ වන සියයට 10 ක් වන ග්‍රාහක බද්ද, සෙසු රැහැන් රහිත දුරකථන ද ආවරණය වන පරිදි පුළුල් කරන ලදී.

- එන්ජින් ධාරිතාව හා බහාලුම් ධාරිතාව පදනම් කර ගනිමින් මෝටර් රථ වලින් අය කරනු ලබන ප්‍රාදේශීය යටිතල පහසුකම් බද්ද සියයට 2.5 සිට සියයට 5 දක්වා සහ සියයට 7.5 සිට සියයට 10 දක්වා ඉහළ නංවන ලදී.

- 2008 ජනවාරි 01 වැනි දිනෙන් පසුව *අපි වෙනුවෙන් අපි අරමුදල* සඳහා ලැබෙන පරිත්‍යාගයන් "සම්පූර්ණ පරිත්‍යාග මුදලම ආදායම් බදු ගණනය කිරීමේදී සුදුසුකම් ලබන ආදායමක්" ලෙස අඩුකර ගැනීම සඳහා ඉඩ ලබාදෙන ලදී.

- 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිතියක් හෝ සමූපකාර ග්‍රාමීය බැංකුවක් විසින් පවත්වාගෙන යන ජංගම ගිණුම් හෝ ඉතිරි කිරීමේ ගිණුම් හර බද්දෙන් නිදහස් කරන ලදී.

- *අපි වෙනුවෙන් අපි* අරමුදල් මගින් පවත්වාගෙන යන ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුම් හර බද්දෙන් නිදහස් කරන ලදී.

- 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතට අනුව, මත්පැන් අලෙවිය හෝ ව්‍යාපාර කටයුතු සඳහා වන මුදල් ලැබීම් හෝ ගෙවීම් හෝ ඕනෑම දේපලක් හා බලපත්‍ර ගාස්තු සඳහා වන මුද්දර ගාස්තු සංශෝධනය කරන ලදී.

2008 මාර්තු 14

- සිගරට් සඳහා වන නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

2008 අප්‍රේල් 01

- *අපි වෙනුවෙන් අපි* අරමුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුම් හර බද්දෙන් නිදහස් කරන ලදී.

- 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි වූ සමූපකාර සමිති සහ ග්‍රාමීය බැංකුවල ලාභ හා ආදායම් වසර 5 ක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.

- සමූපකාර ග්‍රාමීය බැංකු ද ඇතුළත්ව සමූපකාර සමිති විසින් බැංකු හෝ මූල්‍ය ආයතනවල පවත්වාගෙන යන ඉතුරුම් ගිණුම්වල පොලී ආදායම, සියයට 10 ක් වූ රඳවුම් බද්දෙන් නිදහස් කරන ලදී.

- දැනට ප්‍රදානය කර ඇති බදු විරාම සඳහා පහත දැක්වෙන වෙනස්කම් සිදු කරන ලදී.
  - නැගෙනහිර නවෝදය වැඩ සටහන යටතේ සිදුකරන නව ආයෝජන මගින් ලැබෙන ලාභ හා ආදායම් එම ආයෝජන රුපියල් දශ ලක්ෂ 30 කට වඩා වැඩිවීම හා එම ආයෝජන වසර 2010 ට පෙර සිදු කිරීම යන කරුණුවලට යටත්ව අවුරුදු 5 ක කාල සීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
  - අඩු සංවර්ධනයක් පෙන්නුම් කරන ඕනෑම ප්‍රදේශයක අලුතින් පිහිටවනු ලබන ව්‍යාපාර විසින් (මුදල් ඇමතිවරයා විසින් අඩු සංවර්ධිත ප්‍රදේශ ලෙස අර්ථ දක්වා ඇති) උපයනු ලබන ආදායම් හා ලාභ, අවුරුදු 3 ක කාල සීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
  - ආයෝජන මණ්ඩල නීතිය හෝ දේශීය ආදායම් පනත යටතේ දැනට ලබා දී ඇති බදු විරාම කල් පිරීමෙන් පසුව තවදුරටත් දීර්ඝ නොකරනු ඇත.
  - ආයෝජන මණ්ඩල නීතිය හෝ දේශීය ආදායම් පනත යටතේ 2008 අප්‍රේල් 01 දා සිට ආරම්භ වන බදු විරාම කාල සීමාව වසර 3 ක උපරිමයකට යටත්වන අතර බදු විරාම කාල සීමාව ඉකුත් වූ පසුව ලැබෙන ලාභ හා ආදායම් මත ආදායම් බද්ද පළමු වසර තුළ සියයට 5 ක්ද, දෙවන වසර තුළ සියයට 10 ක් ද, තෙවන වසර තුළ සියයට 15 ක් ද යනාදී වශයෙන් වේ.
- මැණික් අපනයනය සඳහා ලබා දී තිබූ ආදායම් බදු නිදහස, ඔප නොදැමූ ස්වරූපයෙන් ආනයනයකර පසුව කපා ඔප දමා අපනයනය කරනු ලබන මැණික්වලින් ලැබෙන ලාභ හා ආදායම් ද ආවරණය වන පරිදි පුළුල් කරන ලදී.
- රාජ්‍ය මැණික් සංස්ථාවේ අධීක්ෂණය යටතේ පවත්වන මැණික් වෙන්දේසිවල දී විකුණනු ලබන මැණික්වල වටිනාකම මත සියයට 2.5 ක් වූ ආදායම් බද්දක් පනවන ලදී.
- කිසියම් සමාගමක් හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගලයකු ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී කිසියම් වෘත්තියක් හෝ රැකියාවක් සේවාවක් සැපයීම තුළින් ලබන විදේශීය ඉපයීම් බැංකු හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම් එය ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- අනේවාසික විදේශ සමාගමක් විසින් එම සමාගමේ කොටස් හිමි ඕනෑම දේශීය කොටස්කරුවකු වෙත 2008 අප්‍රේල් 1 දින හෝ ඉන් පසුව ගෙවනු ලබන ලාභාංශ, බැංකු හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබයි නම්, එම ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- සේවා නියුක්තිකයන්ට ප්‍රතිලාභ ලෙස කිසියම් සමාගමක කොටස් නිකුත් කරන ලද්දේ නම් එම හිමිකම මත ගෙවනු ලැබූ ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී. නමුත් මෙහිදී මෙම කොටස් නිකුත් කිරීමේ ක්‍රියාමාර්ගය සාධාරණ එකක් බව ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල්වරයා විසින් සෑහීමකට පත්විය යුතුය.
- 2008 අප්‍රේල් 01 දිනට පසුව යම් නේවාසිකයකු විසින් මෙරටින් බැහැර සිදු කරන ආයෝජනයන් මත ලැබෙන පොලී ආදායම, බැංකු හරහා මෙරටට ප්‍රේෂණය කරනු ලබයි නම් එම පොලී ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- කිසියම් බැංකුවක් විසින් *නැගෙනහිර නවෝදය* වැඩ සටහන යටතේ ක්‍රියාත්මක වන නව ව්‍යාපාරයක ආයෝජනය කිරීම සඳහා ලබාදෙනු ලැබූ හා එම මුදල සම්පූර්ණයෙන්ම එම වැඩ සටහනට යොදවා ඇති කිසියම් ණය මුදලක් මත ලැබෙන පොලී ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- නාගරික සංවර්ධන අධිකාරිය හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයක් යටතේ, අඩු ආදායම් ලාභීන් හට නිවාස ඉදිකිරීමේ හා විකිණීමේ යෙදෙන ව්‍යාපාරයක් එමගින් උපයන ආදායම් හා ලාභ, එම නිවාසවල බිම් ප්‍රමාණය වර්ග අඩි 500 නොඉක්මවන හා 2013 අප්‍රේල් 01 ට පෙර නිවාස විකුණා අවසන් කර තිබේ නම්, ආදායම් බදුවලින් නිදහස් කරන ලදී.

- ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ඕනෑම රාජ්‍ය සංස්ථාවක් ඕනෑම රාජ්‍ය ආයතනයක් හෝ මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් වෙනුවෙන් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැපයීම මගින් ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම් උපයා ගන්නා ලාභ හෝ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයා ගන්නා ලාභ හා ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සේවයේ නියුතු ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයින් ශ්‍රී ලංකාවේ පුද්ගලයින් හා සමාන පදනමකින් සලකා ආදායම් බද්දට යටත් කරන ලදී.
- ගුවන් සංතරණ පනත යටතේ ලියාපදිංචි කිසියම් ගුවන් සේවාවක රැකියාවේ නියුතු ශ්‍රී ලාංකික ගුවන් නියමුවන් උපයන ආදායම මත පනවන ආදායම් බදු අනුපාතය සියයට 20 නොඉක්මවිය යුතු බවට විධිවිධානයන් පනවන ලදී.
- නැව් සඳහා ලබාදෙන සියයට 33 1/3 ක් වන ප්‍රාග්ධන දීමනාව, එම නැව් හිමිකරුවන්ට පමණක් ලබා දීමට තීරණය කරන ලදී.
- ආදායම් බදු ගණනය කිරීමේදී කල්බදු ව්‍යාපාරවලදී ඇරීමට සිදුවන පාඩු එම ව්‍යාපාරයන්හිදී ලැබෙන ලාභවලින් පමණක්ම පියවීම සඳහා ඉඩ ලබාදෙන ලදී.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් සමූපකාර සමිතිවල පවත්වාගෙන යන ඉතුරුම් ගිණුම්වලින් ලැබෙන පොලී ආදායම, රුපියල් 200,000 දක්වා ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- ආර්ථික සේවා ගාස්තු සඳහා ලියාපදිංචි වූ කිසියම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක්, විශේෂිත ගාස්තු, කුලී හෝ වෙනත් ඒ හා සමාන ගෙවීම් සහ කතෘ භාග, වාර්ෂික, කළමනාකරණ ගාස්තු හෝ ඒ හා සමාන ගෙවීම් රඳවා තබාගැනීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
- ඉහළ තාක්ෂණයෙන් යුත් චිත්‍රපටශාලා ඉදිකිරීම වෙනුවෙන් හා දැනට පවත්නා චිත්‍රපට ශාලා ඉහළ තාක්ෂණික චිත්‍රපටශාලා බවට නවීකරණය කිරීම සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 25 හා රුපියල් දශ ලක්ෂ 10 බැගින් දරන ලද වියදම් ආදායම් බදු ගණනය කිරීමේ දී සුදුසුකම් ලබන ගෙවීම් වශයෙන් සලකා අඩුකර ගැනීමට ඉඩ ලබාදෙන ලදී. තවද, චිත්‍රපටයක් නිෂ්පාදනය සඳහා ආයෝජනය කරනු ලබන වියදම් සම්බන්ධයෙන් වූ සුදුසුකම් ලබන ගෙවීම් දීමනාව රුපියල් දශ ලක්ෂ 25 සිට රුපියල් දශ ලක්ෂ 35 දක්වා වැඩිකරන ලදී.
- පුද්ගල ආදායම් බදු මත සමාජ වගකීම් බද්ද අය කිරීම නවතා දමන ලදී.
- ආර්ථික සේවා ගාස්තු සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්කම් සිදු කරන ලදී.
  - ඕනෑම ව්‍යාපාරයක පිරිවැටුමෙහි විදේශ විනිමය ඉපයීම් හෝ අපනයන ආදායම් ඇතුළත් වේ නම් ඒ මත වන ආර්ථික සේවා ගාස්තුව සියයට 0.25 කට සීමා කරන ලදී.
  - මිලදී ගන්නන්ගේ කාර්යාල (Buying Offices ) හරහා සිදුකරනු ලබන ඇඟලුම් අපනයනය මත අයවන ආර්ථික සේවා ගාස්තුව සියයට 0.1 කට සීමා කරන ලදී.
  - මෝටර් රථ හා මත්පැන් අලෙවිය මත අයකරනු ලබන ආර්ථික සේවා ගාස්තුව සියයට 0.5 සිට සියයට 1 දක්වා වැඩිකරන ලදී.
  - විදේශ විනිමය සම්බන්ධ නොවේය යන පදනම මත ඔප නොදැමූ මැණික් ආනයනය හා ඒවා කපා ඔප දමා අපනයනය කරන්නේ නම් අයකරනු ලබන ආර්ථික සේවා ගාස්තුව එම භාණ්ඩයේ වටිනාකම මත සියයට 0.25 ක් හෝ අගය එකතු කිරීම මත සියයට 0.1 ක් ලෙස නියම කිරීම.

- තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ පුහුණු ආයතන, අධ්‍යාපනික ආයතන හා ව්‍යාපාර ක්‍රියාවලින් බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ (BPO) වල එ.ජ. ඩොලර් දශ ලක්ෂ දෙකකට නොඅඩු ආයෝජන සිදුකළ විදේශිකයන් විසින් ඉඩම් මිලදී ගැනීම පැවරුම් බද්දෙන් නිදහස් කරන ලදී.

2008 අප්‍රේල් 22
- ගුවන් යානා සහ නැව් උකස් කිරීම සඳහා වන ඔප්පු මුද්දර බද්දෙන් නිදහස් කරන ලදී.

2008 සැප්තැම්බර් 15
- සිගරට් මත වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී.

2008 ඔක්තෝබර් 01
- තේ සකස් කිරීම සඳහා යොදාගන්නා දේශීයව නිෂ්පාදනය කරනු ලබන යන්ත්‍රසූත්‍ර එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

2008 ඔක්තෝබර් 08
- සම්මත සැර මද්‍යසාර ලීටරයකට රුපියල් 57 ක් හා බීර වෙනුවෙන් ලීටරයකට රුපියල් 10 ක් බැගින් සුරා බදු ඉහළ දමන ලදී.

2008 ඔක්තෝබර් 21
- ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද විදේශ මුදල් වටිනාකම්වලින් යුතු ස්වෛරීත්ව බැඳුම්කර අලෙවි කිරීම මගින් ලබන වෙළෙඳ ලාභ හා ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.

2008 දෙසැම්බර් 30
- එල්.පී. ගෑස් (LP Gas) සඳහා සියයට 5 ක හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 8 ක නිෂ්පාදන බද්දක් පනවන ලදී.

2008 දෙසැම්බර් 31
- සිගරට් සඳහා වන නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

2009 ජනවාරි 01
- බැංකු හා මූල්‍ය ආයතන හැර ආනයන, නිෂ්පාදන සහ අනෙකුත් සේවා සපයන ආයතනවල විකුණුම් මත සියයට 1 ක ජාතිය ගොඩ නැගීමේ බද්දක් වසර දෙකක කාලයක් සඳහා පනවන ලදී.
- සාමාන්‍ය එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 12 දක්වා අඩු කරන ලදී.
- එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචිවීමේ පිරිවැටුම් සීමාව, බදු කාල පරිච්ඡේදයකට රුපියල් 650,000 ක් හෝ වර්ෂයකට රුපියල් දශ ලක්ෂ 2.5 දක්වා වැඩිකරන ලදී.
- එකතු කළ අගය මත විකල්ප බද්ද සඳහා ලියාපදිංචිවීමේ පිරිවැටුම් සීමාව රුපියල් දශ ලක්ෂ 3 දක්වා ඉහළ දමන ලදී.
- දේශීයව නිෂ්පාදනය කරනු ලබන ශල්‍යකර්ම සඳහා භාවිතා වන ගෝස් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- සියයට 20 සුඛෝපභෝගී බදු අනුපාතයට අදාළ එකතු කළ අගය මත බදු සඳහා වන ප්‍රතිදාන ලබා ගැනීමේ හැකියාව සියයට 15 සිට සියයට 12 දක්වා අඩු කරන ලදී.
- ප්‍රජා දායකත්වයෙන් සිදු කරනු ලබන ගම නැගුම, මඟ නැගුම සහ ප්‍රජා වාරිමාර්ග ව්‍යාපෘති හා සම්බන්ධ ඉදිකිරීමේ කටයුතු එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- ජංගම හා රැහැන් රහිත දුරකථන සඳහා අදාළ වන සියයට 10 දුරකථන ග්‍රාහක බද්ද ස්ථාවර දුරකථන සඳහා අදාළ වන පරිදි දීර්ඝ කරන ලදී.
- ත්‍රස්තවාදී කටයුතු හේතුවෙන් විනාශ වූ බස් රථ වෙනුවට නව බස් රථ ආනයනය කිරීම 2008 ජූලි 09 දින හෝ ඊට පසුව සිදුකර ඇත්නම් ඒවා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- ජාතික ශිල්ප සභාව විසින් ආනයනය කරනු ලබන පිත්තල තහඩු, පිත්තල කුට්ටි, නූල්, සායම්, පැරපින් වැක්ස් සහ සකස් කළ ඉටි ආනයනය, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- සූර්ය බලය නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන තෝරාගත් සූර්ය බලශක්ති පද්ධති සහ උපාංග ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- විදුලිබලය ජනනය කිරීමේ කාර්යය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට සැපයීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රසායනික නැප්තා ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- ආනයනය කරනු ලබන භාණ්ඩ මත රේගුවේදී ගෙවනු ලබන එකතු කළ අගය මත බදු සඳහා රේගු ප්‍රකාශය මත බදු ප්‍රතිදාන ඉල්ලා සිටිය හැකි කාල සීමාව වර්ෂ දෙකක් දක්වා දීර්ඝ කරන ලදී.

**අපේක්ෂිත**

2009 අප්‍රේල් 01

- පුද්ගල ආදායම් බදු අනුපාත පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම.

| කාණ්ඩය | බදු අනුපාතය |
|---|---|
| (1) පළමු රුපියල් 300,000 | නැත |
| (2) ඊළඟ රුපියල් 400,000 | සියයට 5 |
| (3) ඊළඟ රුපියල් 400,000 | සියයට 10 |
| (4) ඊළඟ රුපියල් 400,000 | සියයට 15 |
| (5) ඊළඟ රුපියල් 500,000 | සියයට 20 |
| (6) ඊළඟ රුපියල් 500,000 | සියයට 25 |
| (7) ඊළඟ රුපියල් 500,000 | සියයට 30 |
| (8) ඉතිරිය | සියයට 35 |

- බැංකු හා මූල්‍ය ආයතනවල තැන්පතු මත වන පොලී සඳහා වන රඳවාගැනීමේ බදු අනුපාත පහත පරිදි සංශෝධනය කිරීම.

| මුළු ආදායම | බදු අනුපාතය |
|---|---|
| (1) රුපියල් 300,000 දක්වා | නැත |
| (2) රුපියල් 300,001 - රුපියල් 1,000,000 | සියයට 2.5 |
| (3) රුපියල් 1,000,001 සහ ඊට වැඩි | සියයට 10 |

- ලෝහෝර් ආර්යා ණය අරමුදල මගින් රජයේ සේවකයින්ට ලබාදෙන ණය සඳහා ලැබෙන පොලිය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- ලේඛකයකුගේ පොතක් විකිණීමෙන් පළමු මුද්‍රණයේ සිට වසරක් ඇතුළත එකී ලේඛකයාට ලැබෙන ලාභයෙන් සහ වේදිකා නාට්‍යයක් පළමුව වේදිකා ගතකළ දින සිට වර්ෂයක් ඇතුළත ලබන ලාභයෙන් සියයට 50 ක් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- යම් ගීතයක් ගුවන් විදුලි හෝ රූපවාහිනී මාධ්‍යයෙන් ප්‍රචාරය වීමේදී ශිල්පීන්ට ලැබෙන කර්තෘ භාගය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- සිනමාශාලාවක් වැඩි දියුණු කිරීම සඳහා දැනට ඇති බදු විරාම කාල සීමාව වර්ෂ 5 සිට වර්ෂ 7 ක් දක්වා දීර්ඝ කිරීම.
- ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සමාගමකට හෝ හවුල් ව්‍යාපාරයකට වෘත්තීමය සේවා සැපයී-මේ යෙදී සිටින සේවා නියුක්තිකයන්ට, තම වැටුප එම සේවය සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවන අවස්ථාවලදී එම ආදායම මත පැන නගින බද්ද සියයට 20 ක් කිරීම.
- දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ සමාගම්වලින් ගෙවනු ලබන ආදායම් බදු සම්බන්ධයෙන් සමාජීය වගකීම් ගාස්තුව අය කිරීම.

- දේශීය ආදායම් පනතේ 153 වන වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයන්ගේ ආදායම් බදු රඳවා ගන්නා අවස්ථාවේදීම ඉදිකිරීමේ කර්මාන්ත සහතික අරමුදල් බද්ද රඳවා ගැනීමේ බද්දක් වශයෙන් අයකර ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම.
- විශාල ව්‍යාපාර සඳහා වාර්ෂිකව උපරිම වශයෙන් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව රුපියල් දශ ලක්ෂ 60 සිට රුපියල් දශලක්ෂ 120 දක්වා වැඩි කිරීම.
- එක් පැකට්ටුවක් කිලෝ ග්‍රෑම් එකකට වැඩි නොවන පරිද්දෙන් තේ පැකට් කර අපනයනය කිරීමේ ව්‍යාපාරයක ලාභ මත ආදායම් බදු සියයට 15 කට නොවැඩි අනුපාතයකට අඩු කිරීම.

**රජයේ වියදම්**

2008 ජූලි 01 - මාසික වැටුප රුපියල් 22,000 ට අඩු රජයේ සේවකයන් සඳහා ජීවන වියදම් දීමනාව ලෙස කලින් එකඟ වී තිබූ රුපියල් 375 ට අමතරව, රුපියල් 625 ක් ලබාදෙන ලදී.

2008 ජූලි 15 - ජීවන වියදම් දීමනාව ගෙවීම හෝ ඊට සමාන වෙනත් දීමනාවක් ගෙවීම සඳහා මීට කලින් ඇතුළත් නොවූ රාජ්‍ය සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ රාජ්‍ය අයිතිය සහිත ආයතනවල සේවකයන් සඳහා ද ජීවන වියදම් දීමනාව ලබාදෙන ලදී.

2008 නොවැම්බර් 11 - 2008 නොවැම්බර් 11 සිට වසරේ ඉතිරි කාලය තුළ රජයේ වියදම් අඩු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග හඳුන්වා දෙන ලදී.

- 2008 නොවැම්බර් වනවිට එකඟතාවයකට පැමිණ නොමැති සියළුම සැපයුම් හා සේවාවන් වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම.
- 2008 නොවැම්බර් වනවිට ආරම්භ කර නොමැති සියළුම ඉදිකිරීම් නවතා දැමීම හා යන්ත්‍ර උපකරණ හා වාහන ඇතුළුව ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම නවතා දැමීම.
- පුනරාවර්තන වියදම් සඳහා අමතර එකඟතාවයන් ඇති කර නොගැනීම.
- අනෙකුත් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීම කල් දැමීම.

2008 දෙසැම්බර් 30 - ලෝක ආර්ථික අර්බුදය හේතුවෙන් ආර්ථිකය මත වන බලපෑම අඩු කිරීමේ අරමුණෙන් 2009 වර්ෂයේදී රුපියල් බිලියන 16 ක ඇස්තමේන්තු ගත වියදමක් සහිත සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී.

2009 ජනවාරි 01 - රජයේ සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව අවම වශයෙන් රුපියල් 1,000 කින් වැඩි කරන ලදී.

- විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 560 කින් වැඩිවන ලෙස රුපියල් 2,000 දක්වා වැඩි කරන ලදී.

**රාජ්‍ය ණය කළමනාකරණය**

2008 මැයි 06 - අනේවාසික ශ්‍රී ලාංකිකයින්, විදේශ රටවල පුරවැසියන්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි සංස්ථාපිත ආයතන හා විදේශීය ආයතනික ආයෝජකයින් හට රුපියල් වටිනාකමින් යුතු භාණ්ඩාගාර බිල්පත්වල නොපියවා ඇති වටිනාකමින් සියයට 10 ක ප්‍රමාණයක් නොඉක්මවන පරිදි ආයෝජනය කිරීම සඳහා අවසර ලබාදෙන ලදී.

2008 මැයි 23 - විදේශ රටවල අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල් සහ ප්‍රාදේශීය අරමුදල් ඇතුළත් කරමින් රුපියල් වටිනාකමින් යුතු භාණ්ඩාගාර බැඳුම්කර තුළ විදේශිකයන්ට ආයෝජනය කිරීම සඳහා සුදුසුකම් ලබන නිර්ණායක සංශෝධනය කරන ලදී.

2008 දෙසැම්බර් 08 - භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සඳහා වන පාර්ලිමේන්තුව මගින් අනුමත ව්‍යවස්ථාපිත සීමාව රුපියල් බිලියන 375 සිට රුපියල් බිලියන 500 දක්වා වැඩිකරන ලදී.

| | | |
|---|---|---|
| 2009 ජනවාරි 01 | - | ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන්ට සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පොදුවේ භාවිතා කළහැකි ප්‍රධාන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම ක්‍රියාත්මක කරන ලදී. |
| 2009 ජනවාරි 09 | - | රුපියල් වටිනාකමින් යුත් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ විදේශ ගතවී සිටින ශ්‍රී ලාංකිකයන්ට හා විදේශීය රැකියාවල නියුතු අයට ද විවෘත කරන ලදී. |

**අපේක්ෂිත**

| | | |
|---|---|---|
| 2009 | - | ප්‍රාථමික වෙළෙඳ නියෝජිත ක්‍රමය විවිධාංගීකරණය කිරීමේ වැඩ සටහනේ ප්‍රථම පියවර ක්‍රියාවට නැංවීම. |

**මූල්‍ය අංශය**

| | | |
|---|---|---|
| 2008 ජනවාරි 01 | - | බාසල් II (Basel II) යටතේ ප්‍රමිති ප්‍රවේශයන් ක්‍රියාවට නැංවීම උදෙසා වාණිජ බැංකුවලට ණය අවදානම් සඳහා ප්‍රමිතිගත ප්‍රවේශය, වෙළෙඳපොළ අවදානම සඳහා ප්‍රමිතිගත මිණුම් ප්‍රවේශය හා මෙහෙයුම් අවදානම් සඳහා මූලික දර්ශක ප්‍රවේශය යොදා ගැනීමට වාණිජ බැංකුවලට නියම කරන ලදී. |
| 2008 පෙබරවාරි 23 | - | කිසියම් බැංකුවක් සඳහා ප්‍රතිවිකුණුම් ගිවිසුම් අනුව ප්‍රතිපත්ති පොළී අනුපාතික මත ණය ලබා ගැනීමේ හැකියාව කිසියම් ලිත් මාසයකදී තුන්වතාවකට සීමා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කළේය. මීට අමතරව, යම් බැංකුවක් ද්‍රවශීලතා හිඟයක දී හෝ ද්‍රවශීලතාවය පුළුල් වශයෙන් සමතුලිත තත්ත්වයකදී මෙම පහසුකම ඉල්ලා සිටින්නේ නම් සියයට 19 ක දණ්ඩණ පොළී අනුපාතිකයක් යටතේ ණය සැපයුම සිදු කෙරේ. |
| 2008 මාර්තු 10 | - | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිකිරීමේ බැංකුව සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලදී. |
| 2008 මාර්තු 31 | - | සිය තැන්පත්කරුවන්ට පිරිනමනු ලබන පොළී අනුපාතික අඩු කිරීම සඳහා ලියාපදිංචි මූල්‍ය සමාගම් මත පැනවූ නියෝගය මගින් ඔවුන් සිය තැන්පතු මත ගෙවන පොලිය හා ණය මත අයකරන පොලිය අතර වෙනස අඩු කිරීමටත් එමගින් ඔවුන්ගේ අරමුදල් පිරිවැය හා ණය දෙන පොළී අනුපාතික පහත හෙළීමටත් බලාපොරොත්තු වේ. |
| 2008 අප්‍රේල් 23 | - | ලියාපදිංචි බැංකු සඳහා සාංගමික යහපාලනය පිළිබඳව 2007 දෙසැම්බර් මස නිකුත් කරන ලද විධානය සංශෝධනය කරන ලදී. මෙමගින් නව විධානය සඳහා පහසුවෙන් අනුගතවීමට තවදුරටත් සහායවීමට අපේක්ෂා කෙරේ. |
| 2008 මැයි 08 | - | නව විධානයන්ට අනුගතවීම පහසු කිරීමේ අරමුණෙන් යුතුව ණය හා අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම සහ වෙන් කිරීම සම්බන්ධව සංශෝධිත විධානයක් බැංකුවලට නිකුත් කරන ලදී. |
| 2008 මැයි 26 | - | ලියාපදිංචි වාණිජ බැංකු විසින් ශාඛා පිහිටුවීමට අදාළ නව ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලදී. ඒ අනුව, බස්නාහිර පළාතේ පිහිටුවන සෑම නව බැංකු ශාඛාවක් සඳහාම අඩුම තරමින් ශාඛා දෙකක් බස්නාහිර පළාතෙන් පිටත පිහිටුවීම සඳහා බැංකුවලට නියම කරන ලදී. |
| 2008 මැයි 29 | - | 2007 ජනවාරි 1 වැනිදා සිට ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිතීන් සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති පෙර දැක්ම නිකුත් කරන ලදී. මේ අනුව, සියලුම බැංකු 2011 සිට මේ සඳහා මුළුමනින්ම අනුගත විය යුතු අතර එය දැනට පවත්නා ගිණුම් ක්‍රම සමග සමාන්තර ලෙසින් 2008 ජූනි මස සිට ක්‍රියාවට නැංවීමට බැංකුවලට නියම කරන ලදී. |
| 2008 අගෝස්තු 15 | - | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2008 ජූලි 08 වන දින ලබාදුන් නියෝගයේ සඳහන් විධිවිධාන ඇතුළත් කරමින් 2008 අප්‍රේල් 23 වන දින සාංගමික යහපාලනය පිළිබඳව බැංකුවලට නිකුත් කළ විධානය සංශෝධනය කරන ලදී. |
| 2008 අගෝස්තු 18 | - | දිගු කාලයක් පුරා ප්‍රකෘති තත්ත්වයට නොපැමිණි ලංකාසෙට්ල් (Lankasettle) පියවීම් ක්‍රමය විකල්පයක් ලෙස භාවිතා කිරීමට පුද්ගලික පරිගණක පදනම් කරගත් ගෙවීම් හා |

| | | |
|---|---|---|
| | | සුරැකුම්පත් පියවීම් ක්‍රමය හඳුන්වා දීමට ලංකාසෙට්ල් ක්‍රමයේ පද්ධති නීති සංශෝධනය කරන ලදී. |
| 2008 අගෝස්තු 20 | - | රජය විසින් 2007 දී නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ද්විතීය වෙළෙඳපොළේ ආයෝජනය කිරීම සඳහා සියලුම ලියාපදිංචි වාණිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබාදෙන ලදී. |
| 2008 සැප්තැම්බර් 05 | - | බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වලට 2008 වර්ෂය සඳහා අදාල වාර්ෂික බලපත්‍ර ගාස්තුව පිළිවෙලින් රුපියල් 500,000 සහ 200,000 දක්වා ඉහළ නංවන ලදී. |
| 2008 සැප්තැම්බර් 25 | - | 1998 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත උල්ලංඝනය කරමින් මූල්‍ය ව්‍යාපාරික කටයුතුවල යෙදෙන පුද්ගලයින් තුන්දෙනෙකු හා සමාගම් තුනක් මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලැබීය. |
| 2008 ඔක්තෝබර් 02 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත කිසියම් බැංකුවකට ලිත් මාසයකට තුන්වතාවක් පමණක් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යටතේ ලබාදෙන ණය ප්‍රමාණය ලිත් මසකට 06 වතාවක් දක්වා දීර්ඝ කරන ලදී. |
| 2008 ඔක්තෝබර් 03 | - | ඒකාබද්ධ අවදානම් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ මාලාවේ කෙටුම්පතක් බැංකු ක්ෂේත්‍රයේ අදහස් හා නිර්දේශයන් ලබා ගැනීම සඳහා නිකුත් කරන ලදී. |
| 2008 ඔක්තෝබර් 08 | - | තැන්පතු ලබා ගැනීමට බලය නොලත් ආයතන හා පුද්ගලයන් බැංකු පද්ධතිය භාවිතා කිරීමෙන් ඇතිවිය හැකි අවදානම සමනය කිරීම සඳහා බැංකුවල ගනුදෙනුකරුවන් ගේ දැනගැනීම පිණිස සහ ගනුදෙනුකරුවන්ගේ අපරීක්ෂාකාරී බව යන ක්‍රියා පටිපාටීන් සඳහා විශේෂ අවධානයක් යොමුකරන ලෙස බැංකුවලින් ඉල්ලා සිටින ලදී. |
| 2008 ඔක්තෝබර් 10 | - | බැංකුවල අවදානම් කළමනාකරණ ක්‍රියාවලින් වැඩි දියුණු කිරීම සඳහා බැංකුවල ක්‍රියාකාරකම් බාහිර ආයතනවලට පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ මාලාවේ කෙටුම්පතක් බැංකු ක්ෂේත්‍රයේ උපදේශනයන් ලබා ගනිමින් නිකුත් කරන ලදී. |
| 2008 ඔක්තෝබර් 15 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත කිසියම් බැංකුවකට කැලැන්ඩර් මසකට 06 වතාවක් පමණක් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යටතේ ලබාදුන් ණය ප්‍රමාණය කැලැන්ඩර් මසකට 10 වතාවක් දක්වා දීර්ඝ කරන ලදී. |
| 2008 ඔක්තෝබර් 17 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 10 සිට සියයට 9.25 දක්වා පදනම් අංක 0.75 කින් පහත දමන ලදී. |
| 2008 ඔක්තෝබර් 29 | - | තත්කාලීන දළ පියවීම් ක්‍රමය වැඩි දියුණු කිරීම නිසා අවසාන වේලාව විනාඩි 15 කින් ඉදිරියට ගෙන එන ලදී. ඒ අනුව තත්කාලීන දළ පියවීම් ක්‍රමය අවසාන කරන වේලාව පස්වරු 5.00 වේ. |
| 2008 ඔක්තෝබර් 31 | - | ලියකියවිලි පිළිගැනීමේ පදනම මත ආනයනය කරන තෝරාගත් භාණ්ඩ වර්ග මත ආන්තික තැන්පතු අවශ්‍යතාවයන් පනවන ලදී. එසේම විදේශ විනිමය අලෙවි කිරීම සඳහා ඉදිරි ගිවිසුම් ඇතිකර ගන්නා වටිනාකම් මත ද සියයට 100 ක තැන්පතුවක් ලබාගත යුතු බවට බැංකුවලට උපදෙස් දෙන ලදී. |
| 2008 නොවැම්බර් 06 | - | මහජනතාවට බැංකු සේවාවන් වල ස්වභාවයන්, ඒවාට අදාළ වන්නා වූ සඵල පොලී අනුපාතිකයන් අවබෝධ කර ගැනීමට හැකියාව ලබාදීම සඳහා නොමඟ යවන සුළු සහ ආචාරශීලී නොවන්නා වූ දැන්වීම් පළ කිරීමෙන් වලකින ලෙස බැංකු වලින් ඉල්ලා සිටින ලදී. |
| 2008 නොවැම්බර් 28 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 9.25 සිට සියයට 7.75 දක්වා පදනම් අංක 150 කින් පහත දමන ලදී. |

**2008 දෙසැම්බර් 05**

- ආසියානු නිෂ්පාදන සංගමයේ ක්‍රියා පිළිවෙත් අනුව සාමාජික රටවලට එ.ජ.ඩොලර් හෝ යූරෝ මගින් ගනුදෙනු කිරීමට හැකිවන සේ ආසියානු නිෂ්කාශණ සංගමයේ ගිවිසුම් සහ ක්‍රියා පිළිවෙත් 2009 ජනවාරි 01 සිට සංශෝධනය කරන ලදී. ඒ අනුව, සියළුම ලියාපදිංචි වාණිජ බැංකු වෙත උපදෙස් නිකුත් කරන ලදී.
- රථ වාහන ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීමේදී අදාළ වන ආන්තික තැන්පතු අවශ්‍යතාවය සියයට 100 සිට සියයට 200 දක්වා වැඩි කරන ලදී.

**2008 දෙසැම්බර් 29**

- ලංකා බැංකුව විසින් පත් කරනු ලබන නව අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ කටයුතු කිරීමට හැකිවන ලෙස සෙලාන් බැංකුවේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට ලංකා බැකුවට පවරන ලදී.

**2008 දෙසැම්බර් 31**

- 2008 අංක 4 දරන මූල්‍ය සමාගම් (සාංගමික සහ පාලන සංශෝධිත) විධානය නිකුත් කරන ලදී.

**2009 ජනවාරි 30**

- ලෝක ආර්ථික කටයුතුවල පසුබෑම සහ එයින් සංචාරක කර්මාන්තයට සිදුවන බලපෑම සැලකිල්ලට ගෙන සංචාරක කර්මාන්තය සඳහා සහන ලබාදෙන ලෙස බැංකුවලට උප-දෙස් දෙන ලදී.

**2009 පෙබරවාරි 11**

- ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 10.25 සහ සියයට 11.75 දක්වා පදනම් අංක 25 කින් අඩුකරන ලදී.
- ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා අයකරනු ලබන දණ්ඩන පොලී අනුපාතිකය සියයට 16.50 දක්වා පදනම් අංක 50 කින් අඩුකරන ලදී.

**2009 පෙබරවාරි 27**

- මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 7.75 සිට සියයට 7.00 දක්වා පදනම් අංක 75 කින් පහත දමන ලදී.

**2009 මාර්තු 18**

- ප්‍රති විකුණුම් සඳහා අයකරනු ලබන දණ්ඩන පොලී අනුපාතිකය සියයට 14.75 දක්වා පදනම් අංක 175 කින් අඩු කරන ලදී.
- රථ වාහන ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීමේදී අදාළ වන ආන්තික තැන්පතු අවශ්‍යතාවය සියයට 200 සිට නැවතත් සියයට 100 දක්වා අඩු කරන ලදී.
- ලියකියවිලි පිළිගැනීමේ පදනම මත ආනයනය කරනු ලබන තෝරාගත් භාණ්ඩ වර්ග මත පනවා තිබූ සියයට 100 ආන්තික තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

**අපේක්ෂිත**

- බැංකු සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් හඳුන්වා දීම.
- බැංකුවල පරිණත පරතරය (Matuarity Gap) විශ්ලේෂණය කිරීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් සම්පාදනය කිරීම සහ වත්කම් හා වගකීම්වල පරිණත සෘණාත්මක නොගැලපීම්වල පරතරය සඳහා නියාමන සීමාවන් නිකුත් කිරීම.
- බාසල් II හි දෙවන ආධාරකය සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම සඳහා සූදානම් වීම, අත්හල දේපල පිළිබඳ බැංකු පනතේ IX කොටස (72 සිට 76 දක්වා වගන්තීන්) සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම.
- ඒකාබද්ධ අධීක්ෂණය සඳහා රාමුවක් සකස් කිරීම.
- බැංකුවල අවදානම් හා අනතුරු ඇඟවීමේ සංඥාවන් හඳුනාගැනීම සඳහා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම.
- මූල්‍ය උපකරණ පිළිබඳ නව ගිණුම් ප්‍රමිතීන් (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 සහ 45) ක්‍රියාත්මක කිරීමට බැංකු ක්ෂේත්‍රය සූදානම් කිරීම සඳහා තවදුරටත් කටයුතු කිරීම.